# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

2020 විෂය නිර්දේශය

**නියාමක ප්‍රශ්න පත්‍රය**

# අදියර II

# 203 - ව්‍යාපාර නීතිය [BLA]

අධ්‍යාපන සහ පුහුණුකිරීම් අංශයේ ප්‍රකාශනයකි.

## ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය
## 203 - ව්‍යාපාර නීතිය (BLA)
## නියාමක ප්‍රශ්න පත්‍රය

**අයදුම්කරුවන්ට උපදෙස් (කරුණාකර අවධානයෙන් කියවන්න) :**

**දෙනු ලබන කාලයඃ**

- කියවීම සඳහා විනාඩි 15
- ලිවීම සඳහා පැය 03 යි.

**ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහයඃ-**

- A කොටස, B කොටස සහ C කොටස ලෙස කොටස් 3 කින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විතය.
- සියළුම ප්‍රශ්නවලට උත්තර ලිවිය යුතුය

**ලකුණුඃ**

- එක් එක් කොටස සඳහා ලකුණු :

| කොටස | ලකුණු |
|---|---|
| A | 25 |
| B | 50 |
| C | 25 |
| **එකතුව** | **100** |

- එක් එක් ප්‍රශ්නය සඳහා ලකුණු පෙන්වා ඇත. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා සමත්වීමේ ලකුණු 50% කි.

**උත්තරඃ**

- සියළුම උත්තර,සපයනු ලබන උත්තර පොත්වල ලිවිය යුතුය. ප්‍රශ්නපත්‍රවල ලියනු ලබන උත්තර ලකුණු දීම් සඳහා ඇඟයීමට ලක් නොකරනු ඇත.
- එක් එක් ප්‍රශ්නය සඳහා ඔබේ උත්තරය අළුත් පිටුවකින් ආරම්භ කරන්න.
- සියලුම පෙර වැඩ පැහැදිලිව පෙන්නුම් කළ යුතුය.
- තීරුවල උත්තර නොලිවිය යුතුය.

**උත්තර පොත්ඃ**

- එක් එක් උත්තර පොතේ මුල් පිටුවේ උපදෙස් පෙන්වා ඇත.

**ගණකයන්ත්‍රඃ**

- සංකේත වීජගණිතමය හා අවකලනය සඳහා පහසුකම් සලසා ඇති ඒවා හැර ඕනෑම ගණක යන්ත්‍රයක් අයදුම්කරුවන්ට භාවිත කිරීමට අවකාශය ඇත. වැඩසටහන් කළ හැකි ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.

**ඇමුණුම්ඃ-**

- කළයුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව. එක් එක් ප්‍රශ්නය (වාස්තවික පරීක්ෂා ප්‍රශ්න හැර) කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළයුතු ක්‍රියා පරික්ෂා ලැයිස්තුවේ දී ඇති නිර්වචනය මත පදනම්ව අයදුම්කරුවන් විසින් උත්තර සැපයිය යුතුය.

**වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)**
**අනිවාර්ය ප්‍රශ්න 14 කි.**

**A කොටස**

(මුළු ලකුණු 25)

## *01 වන ප්‍රශ්නය*

**අංක 1.1 සිට 1.6 දක්වා වූ ප්‍රශ්නවලට වඩාත් නිවැරදි වූ උත්තර තෝරන්න. තෝරාගත් උත්තරය ප්‍රශ්නයට දී ඇති අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.**

1.1 උසාවියට අපහාස කිරීමේ වරදට දඬුවම්කිරීමේ අධිකරණ බලය ඇත්තේ කවර අධිකරණයටද?

(1) ශ්‍රේෂ්ඨාධිකරණය. (2) අභියාචනා අධිකරණය.

(3) දිස්ත්‍රික් අධිකරණය . (4) ප්‍රාදේශිය අධිකරණය.

1.2 පහත සඳහන් ඒවා අතුරෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ආවරණය **නොවන්නේ** කුමක්ද?

(1) ජනාධිපති බලතල හා කාර්යයන්.

(2) මහජන ආරක්ෂාව.

(3) රාජ්‍ය භාෂාව සහ අධිකරණමය සහ උසාවි භාෂාව පිළිබඳ කරුණු.

(4) අපරාධයක් සිදුකිරීම පිළිබඳ දඬුවම.

1.3 පහත සඳහන් ඒවා අතුරින් පුද්ගල නීතිය සඳහා උදාහරණයක් නොවන්නේ කුමක්ද?

(1) පවුල් නීතිය. (2) ගිවිසුම් නීතිය. (3) අපරාධ නීතිය. (4) දේපල නීතිය.

1.4 පහත සඳහන් ඒවා අතුරින් වලංගු ගිවිසුමක් ඇතිවීම සඳහා අවශ්‍යතාවක් **නොවන්නේ** කුමක්ද?

(1) ප්‍රතිෂ්ඨාව. (2) ගිවිසුම්ගත වීමේ ශක්නුතාවය.

(3) ගිවිසුමේ නීත්‍යානුකුලභාවය. (4) ගිවිසුමට ඇතුළත් වන ස්ථානය.

1.5 භාණ්ඩ විකිණීමේ ආඥාපනතට අනුව විකුණුම් ගිවිසුමක් ඇතිකළ හැකි වන්නේ;

**(a)** ලිඛිතවයි.

**(b)** කටවචනයෙනි.

**(c)** කොටසක් ලිඛිතව සහ කොටසක් කටවචනයෙනි.

**(d)** පාර්ශවයන්ගේ හැසිරීමෙනි.

ඉහත දැක්වූ ඒවා අතුරෙන් නිවැරදි ප්‍රකාශන වන්නේ:

(1) **(a)** සහ **(b)** පමණි. (2) **(b)** සහ **(c)** පමණි.

(3) **(a), (b)** සහ **(c)** පමණි. (4) ඉහත සඳහන් සියල්ල.

1.6 ගිවිසුම් කඩකිරීම සඳහා ගිවිසුම්මය ප්‍රතිකර්ම වන්නේ:

**(a)** හානි සඳහා වන්දි

**(b)** නිරූපිත ලෙස ඉටුකිරීම.

**(c)** නිරෝධාඥාව.

**(d)** අවලංගු කිරිම.

ඉහත දැක්වූ ඒවා අතුරෙන් නිවැරදි උත්තර වන්නේ:

(1) **(a)** සහ **(c)** පමණි.

(2) **(b)** සහ **(c)** පමණි.

(3) **(a), (b)** සහ **(c)** පමණි.

(4) ඉහත සඳහන් සියල්ල.

**(එකකට 2 බැගින් මුළු ලකුණු 12)**

**අංක 1.7 සිට 1.9 දක්වා ප්‍රශ්න ලෙස පහත දක්වා ඇති එක් එක් ප්‍රකාශනය සත්‍යද/අසත්‍යද යන්න සඳහන් කරන්න. සත්‍ය/අසත්‍ය යන උත්තරය ප්‍රශ්නයට දී ඇති අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.**

1.7 හදිසි තත්ත්වයක් වූ විට අවශ්‍යතාව මත නියෝජ්‍යත්වය පැනනගී.

1.8 ආනයනකරුවෙකුට (ගැනුම්කරුවෙකුට) ලැබී ඇති භාණ්ඩ ඉල්ලා සිටීමට අවශ්‍යකරන ලියවිල්ල වන්නේ ණයවර ලිපියයි.

1.9 විකුණුම්කරුවෙකු විසින් මිල ලකුණුකර සාප්පුවක් තුල භාණ්ඩ ප්‍රදර්ශනය කර තිබීම අර්පණය සඳහා කෙරෙන ආරාධනයක් සඳහා උදාහරණයකි.

**(එකකට ලකුණු 01 බැගින් ලකුණු 03)**

**අංක 1.10 සිට 1.14 දක්වා වූ ප්‍රශ්නවලට උත්තර ප්‍රශ්නයට දී ඇති අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.**

1.10 ජාත්‍යන්තර වෙළඳාමේදී භාවිතා කෙරෙන ගෙවීම් ක්‍රම දෙකක් (02) සඳහන් කරන්න.

1.11 පාරිභෝගික කටයුතු අධිකාරී පනත යටතේ ගැනෙන වැරදි දෙකක් (02) සඳහන් කරන්න.

1.12 CIF විකුණුම්කරුවෙකුගේ යුතුකම් දෙකක් (02) ලැයිස්තුගත කරන්න.

1.13 කුළි අයිතිකරුගේ අයිතිවාසිකම් දෙකක් (02) සඳහන් කරන්න.

1.14 සේවකයෙකුට සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් ආපසු ලබාගත හැකි අවස්ථා දෙකක් (02) සඳහන් කරන්න.

**(එකකට 02 බැගින් ලකුණු 10)**

**(මුළු ලකුණු 25)**

***A කොටසේ අවසානය***

**අනිවාර්ය ප්‍රශ්න පහ(5)කි.**

**B කොටස**

(මුළු ලකුණු 50)

## *02 වන ප්‍රශ්නය*

**සාරා** නුගේගොඩ පිහිටි අළුතෙන්ම තැනවූ තම නිවස විකිණීම සඳහා පුවත්පත් වෙළඳ දැන්වීමක් ප්‍රසිද්ධ කළාය. වෙළඳ දැන්වීම දුටු **රාජා** නිවාස පරිශ්‍රය පරීක්ෂා කිරීම සඳහා වේලාවක් නියමකර ගැනීම සඳහා **සාරාට** දුරකතන ඇමතුමක් දුන්නේය. **රාජා** දේපළ පිහිටි ස්ථානයට ගිය විට, ඔහු පැමිණි කාරණයටම වෙනත් ගැනුම්කරුවෙකු වන **චන්ඩි** නැමැත්තාද පැමිණ සිටියාය. දේපළ පරීක්ෂා කිරීමෙන් පසු **රාජා, සාරාගෙන්** දේපළ සඳහා වූ මිල විමසුවේය. රුපියල් මිලියන 45 කට එය විකුණන බව ඇය කීවාය. රුපියල් මිලියන 43 කට එම දේපළ ඇය විකුණන්නේ නම් තමා එය මිලදී ගන්නා බව රාජා කීවේය. රුපියල් මිලියන 40 කට එය විකුණන ලෙස **චන්ඩි, සාරාගෙන්** ඉල්ලා සිටියාය. කෙසේ වෙතත් සතියකට පසු දේපළ රුපියල් මිලියන 35 කට **චන්ඩිට** විකුණූ බව **රාජාට** දැනගැනීමට ලැබුණේය. **සාරා** සහ **රාජා** අතර ගෙය විකිණීම සඳහා ගිවිසුමක් තිබුණේ යැයි **රාජා** තමන්ගේ අයිතිය කියා සිටින අතර **සාරා** ගිවිසුම කඩකර ඇතැයිද කියා සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**(a)** **රාජා** හා **සාරා** අතර සහ **චන්ඩි** හා **සාරා** අතර වලංගු ගිවිසුම් තිබුණේදැයි **පැහැදිලි කරන්න.** (ලකුණු 6)

**(b)** **සාරා**, **චන්ඩිට** විකුණන ලද්දේ **සාරාගේ** දියණිය පැහැරගැනීමට **චන්ඩි** විසින් තර්ජනය කරනු ලැබීම නිසා නම් **සාරා** සහ **චන්ඩි** අතර ගිවිසුමේ වලංගුභාවය **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## *03 වන ප්‍රශ්නය*

අළුතෙන් තැනූ ඉන්දුගේ කාර්යාල පරිශ්‍රය පිරිසිදු කිරීම සඳහා මාර්ගගත වෙබ් අඩවියකින් අළුත් විදුලි වැකියුම් ක්ලීනරයක් ඇය ඇනවුම් කළාය. කාර්යාල පරිශ්‍රයේ මහල් දෙකක් තිබූ අතර,මැදපෙරදිගින් ඇය ආනයනය කළ මිල අධික බුමුතුරුණුවලින් ආවරණය කර තිබුණේය. වැකියුම් ක්ලීනරය සඳහා ඇය රු.15000/- ක් ගෙවුවාය. මාර්ගගත වෙළඳ දැන්වීම, මෙම යන්ත්‍රය කල්පවතින, විශ්වාසනීය, ආරක්ෂිත වැකියුම් ක්ලීනරයක් ලෙස විස්තර කර තිබුණේය. කාර්යාල අභ්‍යන්තරයේ පාට හා තේමාවට ගැලපීම සඳහා ඇය නිල් හා රිදී පාට යන්ත්‍රයක් ඇනවුම් කළාය. කෙසේ වෙතත් වැකියුම් ක්ලීනරය ඇය වෙත ලැබුණු විට එය රෝස සහ රන්වන් පාටින් යුතු එකක් වූ අතර,ඇය බලා සිටි ශෝබන පෙනුමද එහි නොවීය. ඇයගේ කාර්යමණ්ඩල සාමාජිකයෙකු එය පාවිච්චි කිරීමට උත්සාහ කළ අතර බිමට එලා තිබූ බුමුතුරුණුවලට හානි වූ අතර අතිවිශාල හඬක් ද නැඟීය. පිරිසිදු කිරීමේ අරමුණ සඳහා එය පාවිච්චි කළ නොහැකි විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

භාණ්ඩ විකිණීමේ ආඥාපනත යටතේ ව්‍යාංග කොන්දේසි සැලකිල්ලට ගෙන ඉහත සිද්ධි දාමයේ කොන්දේසි කඩ කර තිබේ දැයි **පැහැදිලි කරන්න.** (ලකුණු 10)

## *04 වන ප්‍රශ්නය*

**සීමාසහිත XYZ සමාගමේ** එකම අධ්‍යක්ෂවරුන් වන්නේ **අල්විස්** සහ **පෙරේරාය. අල්විස්** සහ **පෙරේරාගේ** මිත්‍රයෙකු වන **සිල්වා, සීමාසහිත XYZ සමාගමේ** අධ්‍යක්ෂකවරයෙකු ලෙස සීමාසහිත ABC සමාගමට **අල්විස්** සහ **පෙරේරා** විසින් හඳුන්වා දෙන ලදී. **සිල්වා, සීමාසහිත XYZ සමාගමේ** අධ්‍යක්ෂකවරයෙකු ලෙස පත් කර තිබුනේ නැත. **සීමාසහිත XYZ සමාගමේ** අධ්‍යක්ෂකවරයෙකු ලෙස **සිල්වා** රුපියල් මිලියන 2.5 ක මෝටර් රථයක් ණය පදනම මත **සීමාසහිත ABC සමාගමෙන්** මිලදී ගත්තේය. කෙසේ වෙතත් මෙම ගෙවීම පියවා දැමීම සීමාසහිත XYZ සමාගම විසින් ප්‍රතික්ෂේප කරන ලද අතර, **සිල්වා** එම සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්කර නැති බවද ඔහුට මෝටර් රථයක් මිලදී ගන්නා ලෙස ඉල්ලීම් සිදු නොකල බවද **සීමාසහිත ABC සමාගමට** දන්වා යවන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**(a)** **සිල්වා** විසින් මිලදී ගත් මෝටර් රථය සඳහා ගෙවිය යුතු මුදල **සීමාසහිත XYZ සමාගම** ගෙවිය යුතු දැයි **පැහැදිලි කරන්න.** **(ලකුණු 07)**

**(b)** අපරානුමතියෙන් නියොජ්‍යත්වය ඇති කිරිමට අවශ්‍යතාවයන් තුනක් (03) **සඳහන් කරන්න.** **(ලකුණු 03)**

**( මුළු ලකුණු 10)**

## *05 වන ප්‍රශ්නය*

විනිමය බිල්පත් ආඥාපනතේ 73 වැනි වගන්තිය මඟින් චෙක්පතක් යනු ඉල්ලා සිටිවිට ගෙවිය යුතු බැංකුකරුවෙකු වෙත අණකරනු ලබන විනිමය බිල්පතක් ලෙස නිර්වචනය කර ඇත. මේ අනුව,චෙක්පතක් සඳහා විශේෂ අවශ්‍යතාවයක් වන්නේ එය බැංකුකරුවෙකු වෙත අණකරනු ලැබීම සහ ඉල්ලා සිටින විට එයට ගෙවිය යුතු වීමයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**(a)** චෙක්පතක ලක්ෂණ සහ කාර්යයන් හතරක් (04) **පැහැදිලි කරන්න.** **(ලකුණු 06)**

**(b)** බිල්පත ප්‍රතිග්‍රහණය නොකිරිමෙන් අගරුවන අවස්ථා හතරක් (04) **හඳුනා දක්වන්න.** **(ලකුණු 04)**

**(මුළු ලකුණු 10)**

## *06 වන ප්‍රශ්නය*

ව්‍යාපාර ක්ෂේත්‍රයේ සංවර්ධනය සමඟ මතුවී පැන නැගුන අභියෝග සමඟ මුදල් විශුද්ධිකරණය වැලැක්වීමේ පනත සහ මූල්‍ය ගනුදෙනු වාර්තාකරණ පනත හඳුන්වා දෙන ලදී. 2006 අංක 06 දරණ මූල්‍ය ගනුදෙනු වාර්තාකරණ පනතේ විධිවිධාන අනුව මූල්‍ය බුද්ධි ඒකකය පිහිටුවන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**(a)** මුදල් විශුද්ධිකරණය යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි **පැහැදිලි කරන්න.** **(ලකුණු 03)**

**(b)** මූල්‍ය ගනුදෙනු වාර්තාකරණ පනතේ අරමුණුක් **සඳහන් කරන්න.** **(ලකුණු 03)**

**(c)** මූල්‍ය බුද්ධි ඒකකයේ කාර්යයන් දෙකක් (02) **සඳහන් කරන්න.** **(ලකුණු 04)**

**(මුළු ලකුණු 10)**

## *B කොටස අවසානය*

**එක් අනිවාර්ය ප්‍රශ්නයකි**

(මුළු ලකුණු 25)

## C කොටස

### *07 වන ප්‍රශ්නය*

**(A)** **සීතා ඇඟලුම් විලාසිතා** යනු දහසකට වඩා සේවකයන් සිටින ඇඟළුම් කම්හලකි. කම්හලේ සේවකයන්ගේ සුභ සාධනය සහ ප්‍රතිලාභ සඳහා මෑතකදී වෘත්තීය සමිතියක් පිහිටුවන ලදී. **රජීව්** වෘත්තීය සමිතයේ නායකයා වේ. කර්මාන්තශාලා සේවකයන්ගේ සෞඛ්‍යට සහ සනීපාරක්ෂාවට බලපාන ප්‍රශ්න කීපයක් සම්බන්ධයෙන් ඔහු කළමනාකරණයට පැමිණිලි කළේය. එහෙත්, කළමනාකරණය නිසි සැලකිල්ලක් දැක්වූයේ නැත. එබැවින් සේවකයන් සංකේත වැඩ වර්ජනයක යෙදීමට තීරණය කළේය. සංකේත වැඩ වර්ජනය පැවති දිනයේ කළමනාකරණය වෘත්තීය සමිතිය සමඟ සාකච්ඡාවකට සූදානම් බව ප්‍රකාශ කළේය. වෘත්තීය සමිතිය සහ කළමණාකරනය අතර එකඟත්ව තුළින් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා වඩාත් හොඳ විසඳුමක් ලබා ගැනීම සඳහා ක්‍රියාත්මක විය යුතු ආකාරය ගැන **රජීව්** ඔබගේ උපදෙස් ඉල්ලා සිටී.

අතරතුර, **රජීව්ගේ** සහෝදරයන් වන **කමල්** සහ **ගීතා, රජීව්** සමඟ වෙළඳ දැන්වීම් ව්‍යාපාරයක්, හවුල් ව්‍යාපාරයක් ලෙස පවත්වා ගෙන යාමට ගිවිසුමකට එළඹුනේය. **ගීතා** ව්‍යාපාරයේ වඩා ක්‍රියාශීලී අතර සේවා දායකයන් සමඟ සියළුම ව්‍යාපාරික හමුවීම්වලට ඇය සහභාගි වූවාය. **කමල්** ප්‍රාග්ධනයෙන් සමානව දායක වුවද ව්‍යාපාරයේ එදිනෙදා කටයුතු වලින් ඉවත් ව සිටීමට කැමැත්තක් දැක්වීය. එහෙත් ඔහුගේ බිරිඳ හවුල්කාරියක ලෙස ව්‍යාපාරයට ගෙන ඒමට ඔහුට අවශ්‍යය විය. එහෙත් **ගීතා** එයට විරුද්ධ විය. තවද, ව්‍යාපාරයේ ලාභයෙන් අමතර කොටසක් තමාට ලැබිය යුතු බව **ගීතා** ඉල්ලා සිටින අතර ඔවුන්ගේ ව්‍යාපාර ගිවිසුමේ එබඳු ප්‍රතිපාදනයක් නොමැති බව **රජීව්** පැහැදිලි කරයි. කෙසේ වෙතත් **රජීව්** සහ **කමල්** ව්‍යාපාරයේ ස්වභාවය වෙනස් කිරීමට කැමැත්තක් දැක්වුවද, **ගීතා** එයට තදබල ලෙස විරුද්ධ විය. ව්‍යාපාරය කළමනාකරණය කිරීමේ කාර්යය සඳහා තම දායකත්වය සැපයීම වෙනුවෙන් මුදලක් තමාට ලැබිය යුතු බවට **රජීව්** ඉල්ලා සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**(a)** කර්මාන්තශාලාවේ සේවකයන් සඳහා උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට සාකච්ඡාවේදී **රජීව්**ට දිනාගත හැකි හොඳම විසඳුම කුමක්දැයි **පැහැදිලි කරන්න.** (ලකුණු 07)

**(b)** වෙළඳ දැන්වීම් හවුල් ව්‍යාපාරයේ පහත සඳහන් හවුල්කරුවන්ගේ අයිතිවාසිකම් හා යුතුකම් **විමසන්න**.

(i) කමල්

(ii) ගීතා

(iii) රජීව් (ලකුණු 10)

**(B)** තම ව්‍යාපාරික ආයතනය සඳහා රක්ෂණ ආවරණයක් ලබා ගැනීමට **අරුන්ට** අවශ්‍ය විය. කෙසේ වෙතත් රක්ෂණ නීතියට අදාල මූලික සංකල්ප පිළිබඳව **අරුන්ට** පැහැදිලි අදහසක් නැත. ඔහු තේරුම්ගෙන ඇති ආකාරයට රක්ෂණ නීතිය නිර්වචනය කර ඇත්තේ අනියත සිදුවීමක් සිදුවූ විට රක්ෂණකරු රක්ෂිතයාට මුදල් ප්‍රමාණයක් ගෙවීමටද ඒ සඳහා රක්ෂිතයා රක්ෂණකරුට වාරිකයක් ගෙවීමටද රක්ෂිතයා හා රක්ෂණකරු අතර එළඹගන්නා ගිවිසුමක් ලෙසය. මෙහිදී හානිපූර්ණය හා ආදේශනය යන සංකල්ප මගින් අරමුණු දෙකක කාර්යයන් ඉටු කෙරේ. රක්ෂණ ආවරණය සඳහා ඉල්ලීමට පෙර රක්ෂණය පිළිබඳ මූලික සංකල්ප දෙක තේරුම් ගැනීමට **අරුන්** ඔබේ සහය ඉල්ලා සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

හානි පූර්ණය හා ආදේශනය යන සංකල්ප **පැහැදිලි කරන්න.**

*(ඔබේ උත්තරය සුදුසු උදාහරණ මගින් සනාථ කළ යුතුය)* (ලකුණු 08)

(මුලු ලකුණු 25)

## *C කොටසේ අවසානය*

# කළයුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| | | | |
|---|---|---|---|
| **විශ්ලේෂණය (4)** | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න |
| | | වෙනස් කොට දක්වන්න | යමක් තවෙකකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම |
| | | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම |
| **භාවිතය (3)** | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිතකර ගැළපීම | භාවිත කරන්න | ප්‍රායෝගිකව භාවිතයේ යෙදෙන්න |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම |
| | | පිළියෙළ කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම |
| | | විසඳන්න | ගණනය කිරීම හා හෝ පැහැදිලි කිරීම හරහා විසඳුම් සෙවීම |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මකබව තීරණය කරන්න |
| | | ප්‍රස්ථාර දක්වන්න | ප්‍රස්ථාර මගින් නියෝජනය කරන්න |
| | | සසඳන්න | තවත් එකක් සමග අනුගත/අනුරූප කරන්න |
| **අවබෝධය (2)** | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න |
| | | අර්ථකථනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න |
| | | හඳුනා ගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම |
| **දැනුම (1)** | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම |
| | | අඳින්න | හැඩයක් හෝ රූප සටහනක් ගෙනහැර දැක්වීම |
| **නිපුණතා මට්ටම** | **විස්තරය** | **ක්‍රියා ලැයිස්තුව** | **ක්‍රියා නිර්වචනය** |

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

2020 විෂය නිර්දේශය

## ආදර්ශ විසඳුම්

## අදියර II

# 203 - ව්‍යාපාර නීතිය [BLA]

අධ්‍යාපන සහ පුහුණුකිරීම් අංශයේ ප්‍රකාශනයකි.

**වාස්තවික පරීක්ෂා ප්‍රශ්න (OTQs)**
**අනිවාර්ය ප්‍රශ්න**

(මුළු ලකුණු 25)

**A කොටස**

***ප්‍රශ්න අංක 1 සඳහා යෝජිත උත්තර***

| | | | |
|---|---|---|---|
| 1.1 | 2 | 1.4 | 4 |
| 1.2 | 4 | 1.5 | 4 |
| 1.3 | 3 | 1.6 | 4 |

**(ලකුණු 02 බැගින් ලකුණු 12)**

1.7 සත්‍යය.

1.8 අසත්‍යය.

1.9 සත්‍යය.

**(1 බැගින් ලකුණු 03)**

1.10 – විනිමය බිල්පත්‍ර
- එකතු කිරීමේ ගිවිසුම්
- ණයවර ලිපි
- අත්තිකාරම් ගෙවීම්
- විද්‍යුත් වාණිජ්‍ය

**(ඕනෑම ක්‍රම 02ක්)**

1.11

- භාණ්ඩවල ලකුණු කළ මිලට වඩා වැඩියෙන් විකිණීම
- ශ්‍රී ලංකාවේදී විකිණීමේ අරමුණින් ලබාගත් භාණ්ඩ හා පාලනයේ ඇති භාණ්ඩ වෙළෙන්දෙකු විසින් විකිණීම ප්‍රතික්ෂේප කිරීම.
- වෙළඳාම සඳහා ලබාගත් භාණ්ඩ තමා සතුව නැතැයි වෙළෙන්දෙකු ප්‍රකාශ කිරීම
- වෙළඳාමේ අරමුණ සඳහා තමා සන්තකයේ ඇති භාණ්ඩ යම් කොන්දේසිවලට යටත්කොට විකිණීම.
- වෙළෙන්දෙකු හෝ වෙනත් තැනැත්තෙකු විසින් භාණ්ඩ තොග මුළු කිරීම.(තොග මුළු කිරීම යනු සාමාන්‍ය වෙළඳ අවශ්‍යතාවයන්ට වඩා වැඩි භාණ්ඩ ප්‍රමාණයක් ගබඩාකර සඟවා තැබීම වේ.)
- අධිකාරියේ පූර්ව අනුමැතිය නොලබා නිෂ්පාදකයෙකු හෝ වෙළෙන්දෙකු විසින් ජන ජීවිතයට අත්‍යාවශ්‍ය යැයි ප්‍රකාශයට පත්කර ඇති භාණ්ඩ හෝ සේවා වල මිල වැඩි කිරීම.

**(ඕනෑම වැරදි 02)**

1.12

- ගිවිසුමේ ඇතුලත් විස්තරයේ සඳහන් භාණ්ඩ නැව්ගත කිරීම.
- ගිවිසුමේ සඳහන්කර ඇති ගමනාන්තයට භාණ්ඩ භාරදෙනු ලබන බවට මුහුදෙන් භාණ්ඩ ගෙනයාමේ ගිවිසුමක් ඉදිරිපත් කිරීම.
- ගැනුම්කරුගේ යහපත සඳහා පවතින් රක්‍ෂණ ඔප්පුවක් පිළියෙල කර දීම.
- භාණ්ඩ සඳහා ඉන්වොයිසියක් පිළියෙල කිරීම.

**(ඕනෑම කරුණු 02ක්)**

1.13

- කුලියට දෙනුලබන කාලය තුළ ඕනෑම වෙලාවක බදු කුලී ගිවිසුමේ කාලය ඉකුත් වීමේ දිනය තෙක් නොසිට භාණ්ඩවල අයිතිය,කුලියට දෙන්නා සතු වේ.
- ඕනෑම වේලාවක බදු ගිවිසුම අවසන් කිරීමේ අයිතිය කුලියට දෙන්නා සතු වේ.
- එකම අයිතිකරුවෙකු සමග කුලී බදු ගිවිසුම් එකකට වඩා ඇති තැන්වල බදු ගිවිසුම වෙනුවෙන් කරනු ලබන ගෙවීම් අනුයෝජනය කිරීමේ අයිතිය කුලියට දෙන්නා සතු වේ.සාමාන්‍යයෙන් මෙයින් අදහස් කරනු ලබන්නේ කුළියට දෙන්නා කැමති ගිණුමකට ගෙවීම අදාල කරගනු ලැබීමය.
- ගිවිසුමේ ඔහුගේ බැඳියාව පැවරීමේ අයිතිය කුලියට දෙන්නා සතු වේ.

**(ඕනෑම කරුණු 02)**

1.14

- විශ්‍රාම ගැනීමේ වයසට එළඹීමෙන් (පිරිමි අවුරුදු 55, ගැහැණු අවුරුදු 50)
- ආපසු ඒමක් නැතිව ශ්‍රී ලංකාවෙන් පිටවීම (විදේශ ගත වීම)
- සම්පූර්ණ හෝ ස්ථිර දුබලතාවයට පත්වීම.(වෛද්‍ය ආඥාපනත යටතේ ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයෙකු විසින් එය සහතික කළ යුතුය. )
- විවාහවීම නිසා සේවයෙන් අස්වන ස්ත්‍රී සේවිකාවන් සේවයෙන් අස්වී වී මාස 03 ක් තුළ විවාහ වීම හෝ විවාහ වී වර්ෂ 5ක් තුළ සේවයෙන් අස්වීම සිදුකල යුතුය.
- රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරකට පත්වීම.
- අරමුදලේ සාමාජිකයෙකුගේ අභාවය වුවහොත් ඔහු කලින් නම්කළ පුද්ගලයන්ට ප්‍රතිලාභ සඳහා හිමිකරු විය හැකිය.
- රාජ්‍ය සංස්ථාවල හෝ රජයට අයිති ව්‍යාපාර ආපනශාලා සේවකයින් එම සේවාවලින් ඉවත්වන විට සේ.අ.අ.දායක මුදල් හිමිකම් ආපසු ලබාගත හැකිය.

**(ඕනෑම කරුණු 02)**

**(මුළු ලකුණු 25)**

## *A කොටසේ අවසානය*

**අනිවාර්ය ප්‍රශ්න 05 කි.**

මුළු ලකුණු 50

**B කොටස**

***ප්‍රශ්න අංක 2 සඳහා යෝජිත උත්තර***

| | | |
|---|---|---|
| **ඒකක 2** | - | **ගිවිසුම් නීතිය** |
| ඉගෙනුම් ප්‍රතිඵල | - | වලංගු ගිවිසුමක අවශ්‍යතාවන් පැහැදිලි කිරීම,<br>වැරදීම, අවනිශේධනය, සහ අයුතු බලපෑම පැහැදිලි කිරීම |

**(a)** දී තිබෙන සිද්ධිදාමය අනුව නුගේගොඩ පිහිටි තම අළුත්ම නිවස විකිණීමට **සාරා** පුවත්පත් වෙළඳ දැන්වීමක් පලකර ඇත. ගිවිසුම් නීතිය අනුව අර්පණයක් සඳහා ආරාධනයක් ලෙස මෙය සැලකිය හැකිය.

**රාජා** එම ස්ථානයට පැමිණි විට ගෙය රුපියල් මිලියන 45 කට විකිණීමට **සාරා** අර්පණයක් ඉදිරිපත් කර ඇත. ගිවිසුම සඳහා **සාරා** අර්පණයක් ඉදිරිපත් කළ ප්‍රථම අවස්ථාව මෙය වේ. එහෙත් **සාරා** විසින් ඉදිරිපත් කල අර්පණය **රාජා** පිළිගෙන නැත. ඒ වෙනුවට ඔහු රුපියල් මිලියන 43 කට ගෙය විකුණන ලෙස ඉල්ලා ප්‍රතිඅර්පණයක් **සාරාට** ඉදිරිපත්කර තිබේ. එමනිසා, **සාරා** සහ **රාජා** අතර වලංගු ගිවිසුමක් ඇතිවී නැත.

එම සිද්ධිදාමය සහ තර්කයන් **සාරා** සහ **චන්ඩි** අතර කාරණයටද අදාල වේ. එනම් **සාරා** අර්පණයක් කල විට **චන්ඩි** එය සෘජුව පිළිගෙන නැත. ඔහුද රුපියල් මිලියන 40 ක ප්‍රතිඅර්පණයක් ඉදිරිපත්කර ඇත. එම අවස්ථාවේදී **සාරා** සහ **චන්ඩි** අතර ද වලංගු ගිවිසුමක් ඇතිවී නැත. කෙසේ වෙතත් **සාරා** රුපියල් මිලියන 35 කට **චන්ඩිට** දේපළ විකුණන ලද්දේ නම්, **සාරා** සහ **චන්ඩි** අතර වලංගු විකුණුම් ගිවිසුමක් ඇති වී ඇත. **(ලකුණු 6)**

**(b)** පාර්ශවයන් අතර වලංගු ගිවිසුමක් පිහිටුවා ගැනීමේදී අවශ්‍යතා කිහිපයක් සපුරාගත යුතු වේ. ඒවා පහත පරිදි වේ:

- පාර්ශවයන් අතර එකඟතාවය
- ප්‍රතිෂ්ඨාව
- නෛතික සම්බන්ධතාවයන් බිහි කිරීමේ අභිලාශය
- ගිවිසුමේ නීත්‍යානුකූලභාවය
- කැමැත්ත ලබාදීමේ යථාතත්වය

(ඉහත දැක්වෙන සියළුම සාධක සඳහන් කිරීම අවශ්‍ය නොවේ. අයදුම්කරුවන් කැමැත්ත ලබාදීමේ යථාතත්වය හඳුනාගෙන ඇත්නම් උත්තරයේ විෂය පථය සඳහා එය ප්‍රමාණවත්ය.)

කැමැත්ත ලබාදීමේ යථාතත්වය යටතේ නිදහස් කැමැත්ත මත පදනම් වූ එකඟත්වයක් තිබීම අත්‍යාවශ්‍යය. කෙසේ වෙතත් ගිවිසුම ඇතිකරගන්නා අවස්ථාවේදී යම්කිසි ප්‍රමාණයක අයුතු බලපෑමක් පවතින්නේ නම් එම නිදහස් කැමැත්ත කෙරෙහි එය බලපෑමක් ඇතිකරනු ඇත.

දී ඇති සිද්ධිදාමය අනුව චන්ඩි සාරාගේ දියණිය පැහැර ගැනීමට තර්ජනය කර ඇත.ඒ අනුව ගිවිසුමේ වලංගුභාවය කෙරෙහි එය බලපෑම් ඇති කල හැකි අතර ගිවිසුම බල රහිත කල හැකි වනු ඇත.

**<u>Barton v. Armstrong</u>** **(ලකුණු 04)**

**(මුළු ලකුණු 10)**

*ප්‍රශ්න අංක 03 සඳහා යෝජිත උත්තර*

| | | |
|---|---|---|
| **ඒකක 3** | - | **භාණ්ඩ විකිණීමේ නීතිය** |
| ඉගෙනුම් ප්‍රතිඵල | - | ව්‍යාංග කොන්දේසි සහ ප්‍රතිඥාහාර පැහැදිලි කිරීම |

දී ඇති සිද්ධිදාමය අනුව,අළුතෙන් තැනවූ තම කාර්යාල පරිශ්‍රය පිරිසිඳු කිරීම සඳහා ඉන්දු මාර්ගගත වෙබ් අඩවියකින් අළුත් වැකියුම් ක්ලීනරයක් ඇනවුම්කර තිබේ. ඒ සඳහා ඇය රුපියල් 15000 /- පමණ ගෙවා ඇත. මාර්ගගත වෙළඳ දැන්වීම එම යන්ත්‍රය කල් පවත්නා විශ්වාසනීය සහ ආරක්ෂාකාරී එකක් බව විස්තර කර තිබුණි. දී තිබෙන කරුණු අනුව පදනම් වී, **එම විස්තරය මත පදනම්ව** මෙය භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් ලෙස සැලකිය හැකිය. භාණ්ඩ විකිණීමක් ඇතිවූ කල්හි **අදාලවන ව්‍යාංග කොන්දේසිද** ඇත.

කාර්යාල ඇතුළත පාට තේමාවට ගැලපීම සඳහා නිල් සහ රිදී පාට යන්ත්‍රයක් ඇය විශේයෙන් ඇණවුම්කර තිබිණි. එහෙත් ඇයට ලැබී තිබුණේ රෝස සහ රන්වන් පාට යන්ත්‍රයක් වූ අතර එය ඇය බලා සිටි සෝබන පෙනුමක් නොදැක්විය. මෙම තත්වය අනුව භාණ්ඩය විස්තරයට අනුරූප නොවීය. ඇයට භාණ්ඩය මිලදී ගැනීමට පෙර එය පරීක්ෂා කර බැලීමට අවස්ථාවක් සලසා නොතිබීම හුදෙක් වෙළඳ දැන්වීමේ තිබූ විස්තරය මත විශ්වාසය තැබීමට ඇයට සිදුවී ඇත.

සේවක මණ්ඩලයේ කෙනෙකු මෙය භාවිතා කිරිමේදී බිම් ඇතුරුම්වලට හානි වූ අතර විශාල හඬක්ද ඇති විය. මෙය පිරිසිඳු කිරිමේ අරමුණ සඳහා භාවිතා කල නොහැකිය. භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ 15(02) වගන්තිය අනුව ව්‍යාංග කොන්දේසියක් තිබේ.ඒ අනුව නිෂ්පාදිතය අවශ්‍යතාවයට යෝග්‍ය විය යුතුය. මෙම සිද්ධියේ පිරිසිඳු කිරිමේ අරමුණට භාවිතා කල නොහැකිය. **Beale Vs Taylor**

ඊට අමතරව නිෂ්පාදිතයේ ගුණත්වය පිලිබඳ නියමකරන ආඥාපනතේ 15(02) වගන්තියේ ව්‍යාංග කොන්දේසි උල්ලංඝනය වී තිබේ. එකී අවශ්‍යතාවය අනුව නිෂ්පාදිතයේ පහත දැක්වෙන ගුණත්වය තිබිය යුතුය.

- පොදුවේ සාමාන්‍යයෙන් සපයනු ලබන භාණ්ඩයේ අරමුණු සඳහා ගැලපීමයි
- සතුටුදායක පෙනුම හා නිමාව
- සුළු අඩුපාඩුවලින් තොරවීම
- ආරක්ෂාව
- කල්පැවැත්ම

දී ඇති සිද්ධිදාමයේ මාර්ගගත වෙළෙන්දා විසින් ඉහත දැක්වූ කිසිඳු ගුණත්වයද රැක දී නැත. එමනිසා ඉන්දුට පහත දැක්වෙන ප්‍රතිකර්මය තිබේ.

කොන්දේසි කඩ කිරීම නිසා භාණ්ඩ ප්‍රතික්ෂේප කර ගෙවූ මුදල සහ හානියනැවත අයකර ගැනීම. **(මුළු ලකුණු 10)**

***ප්‍රශ්න අංක 04 සඳහා යෝජිත උත්තර***

| |
|---|
| **ඒකක 04 - නියොජ්‍යත්ව නීතිය**<br>ඉගෙනුම් ප්‍රතිඵල - ප්‍රධානියා සහ නියෝජිතයා අතර සම්බන්ධතාවය කුමන අවශ්‍යතාවයන් යටතේ හඳුනාගනු ලැබේ දැයි පැහැදිලි කිරීම. |

**(a)** දී තිබෙන සිද්ධිදාමය අනුව **අල්විස්** සහ **පෙරේරා** විසින් **සීමාසහිත XYZ සමාගමේ** අධ්‍යක්‍ෂකවරයෙකු ලෙස **සීමාසහිත ABC සමාගමට** සිල්වා හඳුන්වා දී ඇත. නමුත් **සිල්වා, සීමාසහිත XYZ සමාගමේ** අධ්‍යක්‍ෂවරයෙකු ලෙස පත්කර නැත. කෙසේ වෙතත් **XYZ සමාගමේ** අධ්‍යක්‍ෂකවරයෙකු ලෙස සිල්වා, **සීමාසහිත ABC සමාගමෙන්** මෝටර් කාර් රථයක් ණයට මිලදී ගෙන ඇති අතර පසුව **XYZ සමාගම, සීමාසහිත ABC සමාගමට** මුදල ගෙවීම ප්‍රතික්ෂේප කර ඇත. මෙය ප්‍රතිබන්ධනයේ නියෝජ්‍යත්වයක් වන අතර නියෝජිතයාට අධිකාරි බලය ලැබීමකි. ප්‍රතිබන්ධන නීතියෙන් අදහස් වන්නේ යමෙක් කිසිවක් ප්‍රකාශිතව හෝ ව්‍යාංග ලෙස සඳහන් කර ඇති විට පසුව එය එසේ නොවේයැයි කියා සිටීමෙන් වළක්වන බවත්ය. එමනිසා, **සීමාසහිත XYZ සමාගම, සිල්වාගේ** ක්‍රියාව සම්බන්ධයෙන් වගකිව යුතු වේ. ප්‍රතිබන්ධනයෙන් නියෝජිතයා හා ප්‍රධානියා අතර සම්බන්ධතාවයක් මෙහිදී ගොඩ නැගී ඇති නිසාය.

**Freeman Vs Buckhurst Park Properties Ltd**

**(ලකුණු 06)**

**(b)**

- නියෝජිතයා ප්‍රධානියා වෙනුවෙන් නියෝජිතයා වශයෙන් ප්‍රකාශිතව ගිවිසුමට එළඹිය යුතුය.
- නියෝජිතයා ගිවිසුමට එළඹෙන අවස්ථාවේ ප්‍රධානියා හට ගිවිසුමට එළඹීමේ හැකියාව තිබිය යුතුය.
- අපරානුමිතිය මඟින් ප්‍රධානියා අතීතානුයෝගීව වගකිව යුතු වේ
- ප්‍රධානිය අපරානුමිතිය දීමට පෙර ගිවිසුම පිළිබඳ සියළුම වැදගත් කරුණු නියෝජිතයා විසින් අනාවරණය කළ යුතුය.
- නීත්‍යානුකූල නොවන හෝ හිස් ගිවිසුම් සඳහා අපරානුමිති දිය නොහැකිය.
- ප්‍රධානියා සාධාරණ කාලයක් තුළ අපරානුමිතිය දිය යුතුය.

**( ඕනෑම කරුණු 04 ලකුණු 04)**

**(මුළු ලකුණු 10)**

*ප්‍රශ්න අංක 5 සඳහා යෝජිත උත්තර*

| | | |
|---|---|---|
| **ඒකක 6** | - | **ගණුදෙණු කලහැකි සාධනපත්‍රවලට අදාල නීතිය** |
| ඉගෙනුම් ප්‍රතිඵල | - | ව්‍යාපාර සන්ධර්බය තුළ චෙක්පත්, විනිමය බිල්පත් සහ පොරොන්දු නෝට්ටුවල කාර්යයන් පැහැදිලි කිරීම. |
| | - | චෙක්පත් සහ විනිමය බිල්පත්වලට අදාල මූලධර්ම, නීති සහ ඒවායේ වානිජමය වැදගත්කම පැහැදිලි කිරීම. |

**(a)**

- චෙක්පතක් යනු විධිමත් ලිඛිතයකි. එය ඕනෑම වර්ගයේ පෑනකින් යතුරු ලියනයේ හෝ මුද්‍රිතව ලිවිය හැකිය. වාචික නියෝග චෙක්පත් ලෙස සලකනු නොලැබේ.
- චෙක්පතක කොන්දේසි රහිත නියෝගයක් ඇත. මෙහි ගෙවීමේ ඉල්ලීමක් ඇත. මෙම කොන්දේසි රහිත නියෝගය ගනුදෙනුකරු විසින් ඔහුගේ බැංකුව වෙත චෙක්පත් නිකුත් කරනු ලැබේ.
- චෙක්පත් පිටසතර පුද්ගලයන්ට අණ කල නොහැක. ගිණුම්වල අවම ශේෂයක් පවත්වාගන්නා ගනුදෙනුකරුවන්ට චෙක්පොත් පහසුව ලබා දේ.
- ගනුදෙනුකරු විසින් චෙක්පත් අත්සන් කළ යුතු වේ. අත්සන් නොකළ ඇණවුම් හෝ ගිණුම් පවත්වා නොගන්නන් විසින් අත්සන් කළ චෙක්පත් පිලිගනු නොලැබේ.
- ඉල්ලා සිටිනු ලබන්නේ නම් පමණක් චෙක්පත් සඳහා ගෙවනු ලැබේ. ඉදිරිපත් කරනු ලබන චෙක්පත සඳහා ඉල්ලුම මත ගෙවිය යුතුය.
- ගෙවිය යුතු නිශ්චිත ගණන චෙක්පතේ සඳහන් විය යුතුය. චෙක්පතේ මුදල් සඳහා පමණක් ගෙවිය යුතු අතර ගෙවිය යුතු ගණන නිශ්චිත විය යුතුය.
- ගෙවීම ලබන තැනැත්තා නිශ්චිත විය යුතුය.මෙය සත්‍ය තැනැත්තෙකු හෝ කෘතිම තැනැත්තෙකු විය හැකිය.
- බැංකුවේ ගණුදෙනුකරුවා විසින් චෙක්පත නිසිලෙස දිනය යෙදිය යුතුය. බැංකුවේ ගණුදෙණුකරු විසින් චෙක්පත නිසි පරිදි දිනය යෙදීම අවශ්‍යයය.
- චෙක්පතකට අණලද්දා, අණකරු සහ ආදායකයා යනුවෙන් පාර්ශව තුනක් තිබේ.

**(ඕනෑම ලක්ෂණ / කාර්ය 6 කට ලකුණු 06)**

**(b)**

- අණලද්දා බුන්වත් නම්
- අණලද්දා ව්‍යාජ පුද්ගලයෙකු නම්
- අණලද්දා ගිවිසුම්ගත වීමට හැකියාව නැත්තෙක් නම්
- සාධරණ උද්‍යෝගයෙන් කටයුතු කිරිමෙන් පසු එසේ ඉදිරිපත්කරනු ලැබීම කළ නොහැකි නම්
- ඉදිරිපත් කිරිම අවිධිමත් වුවද වෙනත් හේතුවක් මත ප්‍රතිග්‍රහණය ප්‍රතික්ෂේප කර තිබීම.

**(ඕනෑම කරුණු 04 කට ලකුණු 4)**

**(මුළු ලකුණු 10)**

**ප්‍රශ්න අංක 06 සඳහා යෝජිත උත්තර**

| | | |
|---|---|---|
| ඒකක 10 | - | **ව්‍යාපාර පරිසරය සහ නව රෙගුලාසිවලට අදාල වරදවල්** |
| ඉගෙනුම් ප්‍රතිඵල | - | වංචාව, සොරකම, මුදල් විශුද්ධිකරණය, අල්ලස, නොසැලකිල්ල, නිර්වචනය කර ප්‍රධාන වරදවල් පැහැදිලි කිරීම. |
| | - | මූල්‍ය බුද්ධි ඒකකය සහ වාර්තාකරණ අවශ්‍යතාවයන් ගැන කෙටියෙන් සඳහන් කිරීම. |

**(a)** මූල්‍ය විශුද්ධිකරණය යනු සංකීර්ණ බැංකු හුවමාරු හෝ වානිජ ගණුදෙනු හරහා යැවීම සැලැස්වීම තුළින් නීතිවිරෝධි ආකාරයට මුදල් ලබා ගැනීමේ මූලාරම්භයන් වසන්කරලීමේ නීතියට පටහැනි ක්‍රියාවලියයි.

**(ලකුණු 03)**

**(b)** මෙම පනත මගින් මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදය මූල්‍යනය කිරීමට අදාල වරදවල් වැළැක්වීම,අනාවරණය කරගැනීම, සෝදිසිකිරීම සහ නඩු පැවරීමට ඉඩ සලසන සැකකටයුතු මූල්‍ය ගනුදෙනුවලට අදාල දත්ත එක්රැස් කිරීම සිදුකිරීම.

**(ලකුණු 03)**

**(c)**

- මුදල් ගණුදෙනු වාර්තා (CTR) ,විද්‍යුත් අරමුදල් මාරුකිරීම් (EFT) සහ සැකකටයුතු ගනුදෙනු වාර්තා (STR) සියළුම වාර්තාකරන ආයතනවලින් ලබා ගැනීම.
- නඩු පැවරීමට උපකාරීවන මූල්‍ය සලකුණු හඳුනාගැනීමට එකතුකළ දත්ත විශ්ලේෂණය කිරීම උපාය පිළිබඳව, මෙහෙයුම් පිළිබඳව හා උපායමාර්ගික වූ වශයෙන් තුන් ආකාර ආකෘතියකින් දත්ත විශ්ලේෂණය යුක්ත වේ.
- මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදය මූල්‍යනය කටයුතු බොහෝ විට රටවල්වල මායිම් අතර ක්‍රියාකාරකම් වන බැවින් දේශීය මෙන්ම ජාත්‍යන්තර වශයෙන් තොරතුරු ව්‍යාප්ත කිරීම.
- ගණුදෙනුකරුවන් හඳුනාගැනිම හා වාර්තා තබාගැනීම සම්බන්ධයෙන් මූල්‍ය සහ අනෙකුත් වාර්තාකරණ අංශයන්ට රීති නිකුත් කිරීම.
- මූල්‍ය බුද්ධි ඒකකය විසින් මූල්‍ය සහ වෙනත් වාර්තාකරණ අංශයන්ට අනුකුල වීම සඳහා නිකුත්කර ඇති ප්‍රති මුදල් විශුද්ධිකරණය (AML)/ ත්‍රස්තවාදය මූල්‍යමය කටයුතුවලට එරෙහිවීම් (CFT) රීතිවලට අනුගතවිම සහතික කිරීම සඳහා පරීක්ෂණ පැවැත්විම.
- AML/CFT ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සියළුම ඇල්මැති පාර්ශවයන්ගේ දැනුවත්භාවය ඉහළ නැංවීමේ වැඩසටහන් පැවැත්වීම.
- මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදී මූල්‍යනය වැලැක්වීම පිළිබඳව කාර්යක්ෂම උපායමාර්ග සංවර්ධන උපනතීන් සම්බන්ධයෙන් පර්යේෂණ/සම්බන්ධිත විශ්ලේෂණ පැවැත්විම.

**(ඕනෑම කරුණු දෙකක් සඳහා ලකුණු 04)**

**(මුළු ලකුණු 10)**

***B කොටසේ අවසානය***

**එක් අනිවර්යය ප්‍රශ්නයකි**
මුළු ලකුණු 25

**C කොටස**

*ප්‍රශ්න අංක 07 සඳහා යෝජිත උත්තර*

| | | |
|---|---|---|
| **ඒකක 7** | - | **කම්කරු නීතිය හා විකල්ප ආරවුල් විසඳීම** |
| **ඒකක 5** | - | **සමාගම් හා හවුල් ව්‍යාපාර නීතිය** |
| ඉගෙනුම් ප්‍රතිඵල | - | ආවරණය කෙරෙන සේවකයන්, අර්ථලාභීන් සහ අනුමත අඩු කිරීම් පැහැදිලි කිරීම. |
| | - | බේරුම් ක්‍රියාවලිය සහ බේරුම්කාර විනිශ්චය සභාවක කාර්යභාරය පැහැදිලි කිරීම . |
| | - | හවුල් ව්‍යාපාර නීතියට අදාල පද සහ සංකල්ප හඳුනා දැක්වීම. |

**(A)**

**(a)** කර්මාන්තශාලාවේ සේවකයන් වෙනුවෙන් කළමනාකාරීත්වය සමග සාමූහික සම්මුතියකට එළඹීමට **රජීව්ට** පුළුවනි. සාමූහික සම්මුතියක් යනු සේව්‍යයා සහ සේවකයන් / වෘත්තීය සමිති සේවකයන්ද ඇතුළුව පහත සඳහන් කරුණු ගැන එකගත්වයකට පැමිණීමයඃ

- සේවය පිළිබඳ කොන්දේසි
- ඕනෑම සේවකයෙකුගේ /කම්කරුවෙකුගේ /වෘත්තිය සමිතියක වරප්‍රසාද, යුතුකම් හෝ අයිතිවාසිකම්
- ඕනෑම කාර්මික ආරවුලක් විසඳන ආකාරය

සාමූහික සම්මුතියේ ස්වභාවය පිළිබඳ **රාජීව්ට** උපදෙස් දිය යුතුය. මේ වර්ගයේ සම්මුති ලිඛිත විය යුතු අතර සම්මුතියට අදාල පාර්ශව දෙකම අත්සන් කොට කම්කරු කොමසාරිස් වෙත යැවිය යුතුය. ඔහු එය ගැසට් පත්‍රයේ පළකරනු ඇත. සාමූහික සම්මුතිය කම්කරු පාර්ශවයට අවාසිදායක නම් එය ගැසට් පත්‍රයේ පල නොකිරීමේ මනාපය කොමසාරිස් සතුය. ගැසට්පත්‍රයේ පළවීමත් සමඟ එය පාර්ශවයන් අතර වැඩ කිරීම පිළිබඳ ගිවිසුමේ ව්‍යාංග කොන්දේසියක් වනු ඇත.

ගිවිසුම අවසන් කිරීම සඳහා ගිවිසුමෙන් බැඳුන සියලුම පාර්ශ්වයන්ට සහ කම්කරුකොමසාරිස්වරයාට දැන්වීමක් යැවිය යුතුය. **(ලකුණු** 07**)**

**(b)** හවුල් ව්‍යාපාරයක විවිධ වර්ගයේ හවුල් කරුවන් සිටිය හැකඃ

- සාමාන්‍ය හවුල්කරුවන්
- ක්‍රියාකාරි නොවන හවුල්කරුවන්
- වැටුප් ලබන හවුල්කරුවන්

දී ඇති සිද්ධිදාමයේ ගීතා සාමාන්‍ය හවුල්කාරියක් වන අතර ක්‍රියාශීලී ලෙස ව්‍යාපාර කටයුතුවල නියැලේ. වෙළඳ දැන්වීම් සමාගමේ එදිනෙදා කටයුතුවල නොයෙදෙන කමල් ක්‍රියාකාරි නොවන හවුල්කරුවෙකු ලෙස සැලකිය හැකිය. රජීව්ද සාමාන්‍ය හවුල් කරුවෙකුගේ ස්වභාවය ගනී. කෙසේ වෙතත් හවුල් ව්‍යාපාර නීතියට අනුව හවුල්ව්‍යාපාරයේ ඔහුගේ නියැලීම සඳහා වැටුපක් ඉල්ලා සිටීමට ඔහුට හිමිකමක් නැත. ව්‍යාපාරය සමට ලෙස පවත්වා ගැනීමට අනෙකුත් හවුල්කරුවන්ට සහයෝගය දැකවීම ඔහුගේ යුතුකමයි.

ගීතා අකැමැති නිසා කමල්ට ඔහුගේ බිරිද හවුල්කරුවෙකු ලෙස බඳවා ගත නොහැකිය. කමල්ට ඔහුගේ බිරිද හවුල්කරුවෙකු ලෙස බඳවා ගැනිමට අවශ්‍ය නම් සියළුම හවුල්කරුවන් කැමති විය යුතුය.

ගිවිසුමේ සදහන් කර ඇතහොත් මිස ගීතාට ලාභයෙන් අමතර කොටස් සඳහා හිමිකම් පෑම කළ නොහැකිය. මෙසේ ඔවුන් තිදෙනා ලාභය ඔවුන් අතර සමසේ බෙදාගත යුතුය.

**(ලකුණු** 10**)**

**(B)** "වන්දිපූර්ණය" සහ "ආදේශනය" සංකල්පය

| | | |
|---|---|---|
| **ඒකක** 08 | - | **රක්ෂණය,කල් බදු, කුළී සින්නක්කර සහ ණය පිළබඳ නීතිය** |
| ඉගෙනුම් ප්‍රතිඵල | - | රක්ෂණ මූලධර්ම පැහැදිලි කිරීම |

වන්දිපූර්ණය යනු "රක්ෂණය කරනු ලබන්නා ඔහුගේ හෝ ඇයගේ පාඩුව සඳහා වන්දිගෙවනු ලැබීමට හිමිකම් ලබන්නේය" යන මතය මිස ඊට වැඩි දෙයක් නොවේ. වෙනත් වචනවලින් කිවහොත් එය දරණ ලද පාඩුව හෝ හානිය ගෙවනු ලැබීම හෝ වන්දි ගෙවීම වන අතර රක්ෂණය තුළින් ලාභයක් ලබා ගැනීමක් නොවිය යුතුය.

අදාල නඩු තීන්දුව - **Castallain Vs Preston**

උදා:- රු.මිලියන 5ක් වටිනා මෝටර් රථයක් එම මුදලට රක්ෂණය කර ඇති අතර රු.මිලියන 2ක හානියක් සිදුවූයේ නම් වන්දි වශයෙන් ගෙවන්නේ රු.මිලියන 2කි

ආදේශනය එක් තැනැත්තෙකු තවත් තැනැත්තෙකු සඳහා ආදේශනය කිරීම ලෙස නිර්වචනය කළ හැකිය. මෙහිදී රක්ෂිතයා ඔහු විසින්ම යම්කිසි තුන්වන පාර්ශ්වයකට එරෙහි බලාත්මක කරුණු ඕනෑම ප්‍රතිකර්මයක් බලාත්මක කිරීමට රක්ෂණකරුට හිමිකම් ඇත. මෙම සංකල්පය මතුවන්නේ වන්දිපූර්ණ මූලධර්මයේ අනුඅංගයක් ලෙසය. මෙම සංකල්පය ජීවිත රක්ෂණය කෙරෙහි අදාල නොවේ.

උදා:- X තම භාණ්ඩ තොගයට ගිනි රක්ෂණයක් ලබාගෙන ඇති අතර Y ගේ නොසැලකිල්ල හේතුවෙන් ඇති වූ ගින්නකින් භාණ්ඩ තොගය විනාශ විය. රක්ෂණ සමාගම X ට අදාල වන්දිය ගෙවා ඇති විට Y වෙනුවෙන් නඩු පැවරීමේ ශක්‍යතාවය ආදේශන මූලධර්මය යටතේ X ගෙන් රක්ෂණ සමාගමට මාරු වේ.

**(ලකුණු 08)**

**(මුළු ලකුණු 25)**

***C කොටසේ අවසානය***